ගලගමගේ, ප්‍රභාත්
*Poster*

# තොරතුරු තාක්ෂණය, සමානාත්මතාව හා වාණිජ මෘදුකාංග නිදහස් හා විවෘත මූල මෘදුකාංග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

තොරතුරු තාක්ෂණයේ අති දැවැන්ත වර්ධනය හමුවේ අද ලෝකය සුවිසල් වෙනසක් අත්පත් කරගෙන ඇත. සන්නිවේදන තාක්ෂණය හා පරිගණක තාක්ෂණය එක්ව සුසැදි තොරතුරු තාක්ෂණය මිනිස් ජීවිතයේ සියලු ඉසව් තුලට සංක්‍රමණය වී හමාරය. මේ මත ලොව ප්‍රමුඛ ව්‍යවසායක ක්ෂේත්‍රයක් බවටද තොරතුරු තාක්ෂණය පරිවර්තනය වී අවසන්ය. එහෙත් මෙකී තොරතුරු තාක්ෂණයේ මහගු එල පොදු ජනයාට ඒ අයුරින්ම අත්පත් කර ගත හැකිද? මෙම ගැටළුව ප්‍රබලව පැණ නැගෙන්නකි. තොරතුරු තාක්ෂණය තුලද අනෙක් තාක්ෂණයන් තුලදී මෙන්ම සමාජ අසමානතාව බහුලව ක්‍රියාත්මක වනු අපට දැකගත හැකිය. විශේෂයෙන් පර්යන්තය නියෝජනය කරන රාජ්‍යයන්ගේ දිවිගෙවන සාමාන්‍ය ජනයා සඳහා මෙම ගැටලුවේ සාපේක්ෂ තීව්‍රතාව ඉහළය.

තොරතුරු තාක්ෂණය තුල පවතින ප්‍රධාන සංරචකයක් වන්නේ මෘදුකාංගයි. මෘදුකාංග කෙතරම් ප්‍රබලද කිවහොත් අද දෘඩාංග කර්මාන්තයටත් වඩා "ජනප්‍රිය" මෘදුකාංග කර්මාන්තයයි. අප භාවිතා කරන මෘදුකාංග බොහොමයක් වාණිජ මෘදුකාංග ගණයට අයත් වන අතර ඒවා අධික මිල ගණන් යටතේ මිලට ගත යුතු දෑ වෙයි. පරිගණක දෘඩාංග කොටස්ද අපහසුවෙන් සපයා ගැනෙන පසුබිමක එකී දෘඩාංග වලට වඩා වැඩි මිලක් මෘදුකාංග සඳහා වැයවන තතත්වයක් තුල තොරතුරු තාක්ෂණය සමාජ අසමානතා සංරචකයක් ලෙස ක්‍රියා කරන්නේ, සාමාන්‍ය ජනයාට නව තාක්ෂණයෙන්, නව දැනුමින් හා නව ලෝකයෙන් පරිගණක තාක්ෂණය ඔස්සේ අතිශය පහසුවෙන් හා ක්ෂණිකව සිදුකළහැකි කාර්යයන් සඳහා ශ්‍රමායික ආකාර යොදා ගැනීමට සිදුවීම යන කාරණා මගිනි. මෙම තත්වයට විසඳුමක් ලෙස ඉදිරිපත් වන්නේ නිදහස් හා විවෘත මෘදුකාංගයි (Free and Open Source Software - FOSS). තොරතුරු තාක්ෂණය සමාජීයකරණය උදෙසා නිදහස් හා විවෘත මෘදුකාංග ප්‍රබල දායකත්වයක් ලබා දෙමින් සිටී.

මෙම අධ්‍යයනය මගින් වාණිජ මෘදුකාංගයන්ට විකල්පයක් වන නිදහස් හා විවෘත මෘදුකාංග පිළිබඳව සමාජ විද්‍යාත්මක ඇසකින් ප්‍රධාන කොට සාකච්ඡා කෙරෙණු ඇත. මේ යටතේ නිදහස් හා විවෘත මෘදුකාංග සංවර්ධන ආකෘතීන්, නිදහස් හා විවෘත මෘදුකාංග ව්‍යාපෘතීන්, ඒ හා සම්බන්ධ ප්‍රජාව, ලංකාව වැනි පර්යන්තයේ රාජ්‍යයන්ට එහි ඇති සුවිශේෂී වැදගත්කම යනාදී කාරණා නිදහස් හා විවෘත මෘදුකාංගයන්හි තාක්ෂණික පාර්ශවය කෙරෙහිද යම් බර තැබීමක් සිදුකොට සාකච්ඡා කර ඇත. මේ අනුව, මෙම පත්‍රිකාව තුලින් මෙතෙක් ලාංකීය තලය තුල සමාජ විද්‍යාත්මක කෝණයකින් සාකච්ඡාවට බඳුන් වී නැති කාරණාවක් සඳහා ප්‍රවේශයක් ගැනීමට උත්සාහ දරා ඇත.

**මූල පද: විද්‍යාව පිළිබඳ සමාජ විද්‍යාව, නිදහස් හා විවෘත මෘදුකාංග, තොරතුරු තාක්ෂණය, සමාජ අසමානතාව, වාණිජ මෘදුකාංග**